# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බුද්ධ ධර්මය - 2 ශ්‍රේණිය දෙසැම්බර් 1 සතිය.

සැකසුම බලංගොඩ අධ්‍යාපන කලාපය / H.B.C.ප්‍රියදර්ශනී ර/හුණුවල ධර්මරාජ ම.වි




## 30 - ථූපාරාම දාගැබ නමදිමු.

❖ අද මම පුතාලට කියා දෙන්න හදන්නෙ අනුරාධපුරයේ තිබෙන ථූපාරාම දාගැබ ගැනයි. ඒකට පුතේ ථූපාරාම චෛත්‍යය කියලත් කියනවා. පුතාලත් මේ කතාව හොඳට කියව ගන්න.
ඉතිං පුතේ අපේ රටට බුදු දහම ලැබුනට පස්සෙ මුලින්ම ඉදිකල දාගැබ තමයි මේ ථූපාරාමය.ඒ නිසා අපට එය ඉතාමත් වැදගත් වෙනවා. අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් අනුව දේවානම් පියතිස්ස රජතුමා තමයි පුතේ මේ දාගැබ ඉදිකළේ. අපේ බුදු හාමුදුරුවන්ගෙ දකුණු අකු ධාතුව මේ චෛත්‍යයේ තැන්පත් කරල තියෙනවා. ඒ නිසා මේ චෛත්‍යයට වැඳීම බුදුන් වහන්සේට වඳිනවා හා සමානයි කියල කියනවා.

1. දැන් පුතාල මේ ප්‍රශ්න වලට පිළිතුරු කියන්න.

- බුදු දහම ලැබීමෙන් පසුව ඉදිකළ මුල්ම දාගැබ කුමක්ද?
- ථූපාරාම දාගැබ තියෙන්නේ කොහේද?
- මේ දාගැබ හැදෙවුවේ කවුද?
- ඒකට උපදෙස් ලැබුණේ කාගෙන්ද?
- එහි තැන්පත් කර ඇත්තේ කුමක්ද?

2. මේ කවිය තාලයට ගායනා කරන්න. මතකයේ තබා ගන්න.

ගල් කණු වටකොට ඇත්තේ
මහමෙවුනා වන උයනේ
ථූපරාම සෑ රදුනේ
සාධු සාධු නමදින්නේ

3. ථූපාරාම චෛත්‍යය පොතේ ලස්සනට ඇඳ පාට කරන්න. ඊට යටින් මේ කවිය ලියන්න.

4. කළු පාට A4 කොළයක් ගන්න. ඒකෙ හුණු කැටයකින් ථූපාරාම දාගැබ අඳින්න .දැන් සුදු පාට සවි කොළයක් අරගෙන කුඩා කැබලි වලට කඩා ගුලි කර ගන්න.ඇඳපු දාගැබේ ගම් ගා මේ ගුලි අලවන්න. පුතාල ලස්සනට මේ නිර්මාණය කරන්න. ඉන් පසු ථූපාරාම දාගැබ කියා උඩින් ලියා අලවන්න.මෙය බිත්තියේ එල්ලන්න.